# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1888/22 - 2014 නොවැම්බර් මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2014.11.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 94/47 III.

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2) (ආ) සහ 21 (2) (ආ) වගන්ති යටතේ වූ නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6 (2) (ආ) සහ 21 (2) (ආ) වගන්ති මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස සහ පොදු පහසුකම් පිළිබඳ අමාත්‍ය විමල් වීරවංශ වන මා විසින්, මේ නියමය මගින් -

(අ) ඉහත කී ආඥාපනතේ කාර්ය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ඉඩම් ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවටත්, එය "බොරැල්ල ශ්‍රී ගෝතමී විහාර පූජා භූමිය" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බවටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ ; සහ

(ආ) බොරැල්ල ශ්‍රී ගෝතමී විහාර පූජා භූමිය වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ සම්පූර්ණ ප්‍රදේශය සම්බන්ධයෙන් පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවටත් විධානය කරනු ලැබේ.

විමල් වීරවංශ,
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා,
නිවාස සහ පොදු පහසුකම් පිළිබඳ අමාත්‍ය.

2014 නොවැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

*උපලේඛනය*

***බොරැල්ල ශ්‍රී ගෝතමී විහාර පූජා භූමිය සංයුක්ත වන ප්‍රදේශය***

සර්වේ ජනරාල්ගේ 2010 ඔක්තෝබර් මස 21 වන දින අංක සී.ඕ./ටීඑච්අයි/2010/555 (මූලික පිඹුරු අංක කොං9137) දරන සැලැස්මේ නිරූපිත බස්නාහිර පළාතේ, කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගෝතමීපුර ග්‍රාම නිලධාරී වසමේ (කොට්ඨාස අංක 35 බොරැල්ල දකුණ, කොළඹ මහ නගර සභා සීමාව තුළ) බොරැල්ල ග්‍රාමයේ පිහිටි හෙක්ටයාර් 0.7343 ක් විශාලත්වයෙන් යුක්ත පහත දැක්වෙන පරිදි මායිම් වූ ප්‍රදේශය :-

**ඉඩමේ මායිම් පහත පරිදි වේ :**

| | | |
|---|---|---|
| උතුරට | : | පාර, කුරුප්පු පාරේ වරිපනම් අංක 69/14 දරන ඉඩම සහ පාර ; |
| නැගෙනහිරට | : | 2 වන පටුමග සහ ගෝතමී පාර ; |
| දකුණට | : | ගෝතමී පාර, ගෝතමී පාරේ වරිපනම් අංක 83, 83/10, 81/1 දරන ඉඩම් ; |
| බටහිරට | : | කුරුප්පු පාරේ වරිපනම් අංක නොදන්නා ඉඩම, කුරුප්පු පාරේ වරිපනම් අංක නොදන්නා මුඩු ඉඩම, කුරුප්පු පාරේ වරිපනම් අංක 69/50 දරන ඉඩම, පාර සහ කුරුප්පු පාරේ වරිපනම් අංක 69/14 දරන ඉඩම |

11 - 841


1A - G 20602 — 25 (2014/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*